ET/SSS/2022(2023)/OL/50/S/Q/S-3

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

## Student Seminar Series

## ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Drama & Theatre

# නාට්‍ය හා රංග කලාව



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa

The National e-learning Portal for The General Education

මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය : සෞන්දර්යය අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 50 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series**

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව | I, II |
| நாடகமும் அரங்கியவும் | I, II |
| **Drama & Theatre** | I, II |

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි. |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | – 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

**සැලකිය යුතුයි:**

* **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**

- **පහත දැක්වෙන පද්‍ය පාඨ ඇසුරින් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(A) උත්තම වන් ලොව පතලා
එංගලන්ත නමින් යුතු විපුලා

(B) සවන් දී පෙර රාම චරිතේ අසව්
පොරණ ලක්දිව උන්නු රාවණ
ආල වී ජානකී

(C) ආල වෙලා පියසේ පටන්
මං කෝල නැතිව සබයේ මෙදෑං

(D) කිරි මුහුදට නැව ඇවිත් බසින්නේ
කිරි මුහුදේ නැව ගමනි බොලන්නේ

(E) පරසක්වල අපේ මහ රජ්ජුරුවෝ
තෑගි කරයි කිරි පුස්සා
සරු බිම් හොයලා කම්මැලි වීලා
පැන්නුවයි කිරි පුස්සා

01. ඉහත පද්‍ය අතුරෙන් නූර්ති නාට්‍යයට අයත් වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය.

02. ඉහත පද්‍ය අතුරෙන් කෝලම් නාටකයට අයත් වන්නේ,
1) A ය. 2) C ය. 3) D ය. 4) E ය.

03. ඉහත පදා අතුරෙන් නාඩගම් සම්ප්‍රදායට අයත් වන්නේ,
1) A ය. 2) C ය. 3) D ය. 4) E ය.

04. පත්තිනි දේවිය හා සම්බන්ධ ගැමි නාට්‍යයට අදාළ පදා වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය.

05. ඉහත පදා අතුරෙන් නූතන නාට්‍යයට අයත් වන්නේ,
1) B ය. 2) C ය. 3) D ය. 4) E ය.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06. තාලානුකූල චලන යනු, නළුවා
1) පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන්නකි
2) නිශ්චිත රටාවකට අනුව කරන රිද්මයානුකූල ක්‍රියාවකි
3) ආයාසයකින් තොරව සිදු කරනු ලබන්නකි
4) රංග අභ්‍යාස මගින් පුහුණු කරනු ලබන ක්‍රියාකාරකමකි

07. කතන්දරය සහ නාට්‍යය අතර ඇති වෙනසක් වන්නේ,
1) කතා වස්තුවකින් යුක්ත වීම
2) චරිත දක්නට ලැබීම
3) ගැටුමකින් යුක්ත වීම
4) මුල, මැද, අග අනුපිළිවෙලින් තිබීම.

08. අභිරූපණ ශිල්පියෙකු අපහසුවෙන් කන්දක් තරණය කරන අයුරු නිරූපණය කරයි. එහිදී ඔහු යොදා ගන්නේ,
1) දුෂ්කර ගමන
2) සැහැල්ලු ඉදරි ගමන
3) පැති ගමන
4) ආපසු ගමන

09. ඔබ නෙළුම් ඇටයක් යැයි සිතා නෙළුම් ඇටයක් පැළ වී, මතු වී, මලක් බවට පත් වී, නැවත එය පෙති හැලී පරවී යැම නිරූපණය කිරීමට, පුහුණු කළ යුත්තේ,
1) පරිකල්පන අභ්‍යාස 2) සංවේදන අභ්‍යාස 3) ශිථිලකරණ අභ්‍යාස 4) තාපන අභ්‍යාස

10. මනමේ නාට්‍යයේ වැදි රජු හා මනමේ කුමරු අතර සටන් අවස්ථාවේ දී, ප්‍රේක්ෂකයා තුළ ඇති වන්නේ,
1) ආතතිය හා කුතුහලයයි.
2) නොරිස්සුම හා බියයි.
3) දෙගිඩියාව හා සතුටයි.
4) අවිනිශ්චිත බව හා වේදනාවයි.

11. නර්තනයක දී දැකිය හැකි ප්‍රාසංගික ලක්ෂණයක් වන්නේ,
1) ශ්‍රාවක පිරිසක් ඉදිරියේ සජීවීව ඉදිරිපත් කරයි.
2) ඒකලව පමණක් ඉදිරිපත් කරයි.
3) තාල වාද්‍ය භාණ්ඩ සංගීතය සඳහා යොදා ගනියි.
4) නාදය ප්‍රධාන මාධ්‍යය ලෙස යොදා ගෙන ඉදිරිපත් කරයි.

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරින් අංක 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - පාත්‍රයන් ස්වාභාවික ලෙස හැසිරෙයි.
B - පසුතලය වාචික අභිනයෙන් අඟවයි.
C - රිද්මයානුකූල වූ චලන භාවිත කරයි.
D - එදිනෙදා ජීවිතයේ පරිදි වේෂභූෂණ භාවිත කරයි.

12. ඉහත A සහ D ලක්ෂණ දැකිය හැකි නාට්‍යයක් වන්නේ,
1) කදා වළලු 2) ලෝමහංස 3) පරාභව 4) තලමල පිපිලා

13. ඉහත ප්‍රකාශ අතුරෙන් නාට්‍යධර්මී ශෛලියට අයත් ලක්ෂණ වන්නේ,
1) A සහ B ය. 2) B සහ C ය. 3) C සහ D ය. 4) A සහ D ය.

14. 'සවරං' නෘත්ත ගණයට අයත් වන්නේ,
1) ආංගික හා සාත්වික අභිනය භාවිත වන බැවිනි.
2) කිසියම් කතා පුවතක් පාදක කර ගන්නා බැවිනි.
3) හුදු රිද්මයානුකූල නර්තනයක් පමණක් වන බැවිනි.
4) නිශ්චිත අර්ථයක් ප්‍රකාශ වන බැවිනි.

15. මුල් ම සිංහල නූර්තිය හා එහි රචකයා වන්නේ,
1) හරිස්චන්ද්‍ර, පිලිප්පු සිංඤෝ
2) රොලිනා, සී. දොන් බස්තියන් ජයවීර බණ්ඩාර
3) ශ්‍රී වික්‍රම, ජෝන් ද සිල්වා
4) පණ්ඩුකාභය, චාල්ස් ඩයස්

- **පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයා | අනුවර්තනය/පරිවර්තනය | අනුවර්තකයා/පරිවර්තකයා |
|---|---|---|---|
| ද පබ්ලික් එනිමි | **A** | ජන හතුරා | සුනන්ද මහේන්ද්‍ර |
| **B** | මැක්සිම් ගෝර්කි | හිරු නැති ලොව | රංජිත් ධර්මකීර්ති |
| එව්රි මෑන් | හ්‍යුගෝ ෆෝන් හෝෆ් මන්ස්තාල් | සකල ජන | **C** |
| ද ත්‍රී පෙනි ඔපෙරා | බර්ටෝල් බ්‍රෙෂ්ට් | **D** | විජිත ගුණරත්න |
| ද රෙස්පෙක්ටබල් ප්‍රොස්ටිටියුට් | **E** | නම්බුකාර අභිසරු ලිය | උදය මල්ලව ආරච්චි |

16. ඉහත වගුවේ 'A ' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ,
1) හෙන්රික් ඉබ්සන් 2) බර්ටොල්ට් බ්‍රෙෂ්ට්
3) ඔගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් 4) මැක්සිම් ගෝර්කි

17. ඉහත වගුවේ 'B' කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතියේ නම වන්නේ,
1) ඇන්ටිගනී 2) ද ලෝවර් ඩෙප්ත්ස්
3) යෙර්මා 4) දි එල්ඩර් සන්

18. ඉහත වගුවේ ‘D’ කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තනයේ/අනුවර්තනයේ නම වන්නේ,
   1) මකරාක්ෂයා.   2) මුදු පුත්තු.   3) මගුල් ප්‍රස්තාව.   4) පැන්ස තුනේ කතාව.

19. ඉහත වගුවේ ‘C’ කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තකයා/අනුවර්තකයාගේ නම වන්නේ,
   1) යූ.ඒ.ගුණසේකර   2) ඒ.පී.ගුණරත්න   3) බන්ධුල ජයවර්ධන   4) සුගතපාල ද සිල්වා

20. ඉහත වගුවේ ‘E’ කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම වන්නේ,
   1) ටෙනිසි විලියම්ස්   2) ෂොන් පෝල් සාත්‍රේ
   3) ලුයිජි පිරැන්ඩෙලෝ   4) එව්ගිනි ෂ්වාත්ස්

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
|  |  |  |  |  |
| **(A)** | **(B)** | **(C)** | **(D)** | **(E)** |

21. මහාවංශයේ කතාවක් ඇසුරින් නාට්‍යයක් නිර්මාණය කළේ,
   1) ‘A’ ය.   2) ‘B’ ය.   3) ‘C’ ය.   4) ‘D’ ය.

22. ‘ලෝකධර්මී නාට්‍ය ශෛලියේ පුරෝගාමී වන්නේ ,
   1) ‘B’ ය.   2) ‘C’ ය.   3) ‘D’ ය.   4) ‘E’ ය.

23. මනමේ නාට්‍යයේ රංගනයෙන් දායක වූ ශිල්පියා/ ශිල්පිනිය වන්නේ,
   1) ‘ A ’ ය.   2) ‘B’ ය.   3) ‘C’ ය.   4) ‘D’ ය.

24. ‘විකෘති නාට්‍යයෙන් ’ රංගනයට ප්‍රවිෂ්ට වූ ශිල්පියා/ශිල්පිනිය වන්නේ,
   1) ‘A’ ය.   2) ‘B’ ය.   3) ‘C’ ය.   4) ‘D’ ය.

25. ජයලත් මනෝරත්නයන්ගේ නාට්‍ය ගණනාවකටම රංගනයෙන් දායක් වූ ශිල්පියා/ ශිල්පිනිය වන්නේ,
   1) ‘B’ ය.   2) ‘C’ ය.   3) ‘D’ ය.   4) ‘E’ ය.

- පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් 26 සහ 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B

26. ඉහත වෙස් මුහුණු පිළිවෙළින් දැක්වෙන්නේ,
1) අමුක්කු සන්නිය සහ කණ සන්නිය
2) වෙඩි සන්නිය සහ හේවා කෝලම
3) ජස කෝලම සහ ගොළු සන්නිය
4) වාත සන්නිය සහ බිහිරි සන්නිය

27. ඉහත 'A' සහ 'B' වෙස්මුහුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
1) 'A' සහ 'B' කෝලම් මුහුණු දෙකකි.
2) 'A' සහ 'B' සන්නි මුහුණු දෙකකි.
3) 'A' කෝලම් මුහුණකි 'B' සන්නි මුහුණකි.
4) 'A' සන්නි මුහුණකි 'B' කෝලම් මුහුණකි.

- පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 28 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පිත්තල අඹ ගෙඩිය
B - කපු ගහ
C - නයි දඹු රුව
D - කඩුව
E - උනුනු පියන
F - දුන්න

28. රට යකුම හා සම්බන්ධ රංග භාණ්ඩ වන්නේ,
1) A සහ F ය.
2) C සහ D ය.
3) B සහ E ය.
4) B සහ Fය.

29. කොහොඹා කංකාරිය හා සම්බන්ධ රංග භාණ්ඩ වන්නේ,
1) A සහ D ය.
2) C සහ F ය.
3) B සහ E ය.
4) B සහ C ය.

30. මඩු ශාන්තිකර්ම හා සම්බන්ධ රංග භාණ්ඩ වන්නේ,
1) A සහ C ය.
2) C සහ E ය.
3) C සහ D ය.
4) A සහ D ය.




31. ඉහත රූපයේ A සහ B අක්ෂරයන්ගෙන් දැක්වෙන්නේ,
1) A මඩුව සහ B මල් පැල ය.
2) A වෙස් අත්ත සහ B සබය ය.
3) A සබය සහ B මඩුව ය.
4) A වෙස් අත්ත සහ B මල් පැල ය.

32. ඉහත රංග භූමිය භාවිත කරනු ලබන ගැමි නාටක විශේෂය වන්නේ,
1) සොකරි ය.
2) කෝලම් ය.
3) නාඩගම් ය.
4) නූර්ති ය.

33. බී. ඒ. ඩබ්ලිව්. ජයමාන්නයන්ගේ නාට්‍ය නිර්මාණයක් **නොවන්නේ,**
1) රොඩී කෙල්ල
2) වැරදුණු කුරුමානම
3) පෙරලෙන ඉරණම
4) අයිරාංගනී

34. නාඩගම් රංග ශෛලිය හා සම්බන්ධ **නොවන්නේ ,**
   1) කිට්සන් පහන් හා පන්දම් ආලෝකය භාවිතය
   2) උත්තර භාරතීය රාගධාරී සංගීතය යොදා ගැනීම
   3) හොරණෑව, මද්දලය, කයිතාලම යොදා ගැනීම
   4) පූර්ව රංගයේ දී බහුබූතයා, හඬ දූතයන් කරළියට පිවිසීම

35. පසුතල නිර්මාණ සම්බන්ධ සත්‍ය ප්‍රකාශයක් **නොවන්නේ,**
   1) නළු කාර්යය පහසු වන ලෙස යොදා ගනියි.
   2) සරල හා සැහැල්ලු ද්‍රව්‍යයන්ගෙන් නිර්මාණය කර ගනියි.
   3) නාට්‍යධර්මී නාට්‍යවල බහුලව යොදා ගනියි.
   4) නාට්‍ය දර්ශනයට උචිත පරිදි සකස් කර ගනියි.

36. ‘නාට්‍යධර්මී ශෛලියට අයත් නාට්‍ය ඇතුළත් වරණය වන්නේ,
   1) හිරු නැති ලොව, හිත හොඳ අම්මණ්ඩි, කැලණි පාලම, මූදු පුත්තු
   2) අහස් මාළිගා, මහගෙදර, බෝනික්කි ගෙදර, කඹය
   3) මෝදර මෝල, දෙවැනි මහින්ද, මකරාක්ෂයා, මගුල් ප්‍රස්තාව
   4) බෙරහඬ, ජනේලය, මහාසාර, සඳකිඳුරු

37. දික්තල කාලගෝල නාට්‍යයේ ආංගික අභිනය මගින් නිරූපණය කරනු ලබන රංග භාණ්ඩයකි.
   1) කඩුව
   2) කැවුම් මල්ල
   3) මුගුර
   4) ඔරුව

38. රංග ක්‍රීඩාවල යෙදීමෙන්,
   1) මානසික ඒකාග්‍රතාව ඇති කර ගැනීමට හැකි වේ.
   2) ශරීරයේ නම්‍යශීලීත්වය ඇති වේ.
   3) මැනවින් දෙබස් උච්චාරණයට හුරු වේ.
   4) ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව දියුණු වේ.

39. වේෂභූෂණ නිර්මාණය,
   1) වේෂභූෂණ ශිල්පියාගේ අභිමතය පරිදි ම සිදු වේ.
   2) වර්ණ පිළිබඳ අවධානයෙන් සිදු කිරීම වැදගත් නොවේ.
   3) රංග කාලය හා චරිත සංඛ්‍යාව අනුව වෙනස් වේ.
   4) නළුවාගේ බාහිර සමාරෝපයට වැදගත් වේ.

40. ‘ ඔබ සාපේක්ෂයි‘ කෙටි නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
   1) ධනංජය කරුණාරත්න විසිනි.
   2) මංගල සේනානායක විසිනි.
   3) සංජීව උපේන්ද්‍ර විසිනි.
   4) ජෙහාන් ශ්‍රී කාන්ත විසිනි.

*****

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 50 | S | I, II |
|---|---|---|

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව | I, II |
| நாடகமும் அரங்கியலும் | I, II |
| **Drama & Theatre** | I, II |

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**නාට්‍ය හා රංග කලාව (සිංහල) II**

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

01) විකෘති නාට්‍යය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම නාට්‍යයේ ප්‍රධාන චරිතය නම් කර එම චරිතය මුහුණ දෙන ඛේදවාචකය සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මෙම නාට්‍යයේ සමාජය පිළිබඳව මනා අවබෝධයකින් කටයුතු කරන චරිතය නම් කරන්න. (ලකුණු 02)

(iii) මෙම නාට්‍යයේ පසුතල අලංකරණයේ විශේෂ අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) විකෘති නාට්‍යයේ ජවනිකාවන්හි දැක්වෙන ස්ථාන දෙකක් දක්වන්න. (ලකුණු 02)

(v) මෙම නාට්‍යයේ දක්නට ලැබෙන බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ රංග රීතියේ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(vi) මෙහි රංග වස්ත්‍ර නිර්මාණය කළ ශිල්පියා සඳහන් කරන්න. (ලකුණු 02)

02) (i) ප්‍රේක්ෂකයා යනු කවරෙක් ද? (ලකුණු 02)

(ii) ප්‍රේක්ෂකයෙක් සතු විවිධ භූමිකා දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රේක්ෂකයා නාට්‍යයට අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

03) (i) නාට්‍යධර්මී නාට්‍යයක භාවිත වන අංගරචනා ප්‍රභේදය කුමක් ද? (ලකුණු 02)

(ii) අංගරචනා ශිල්පියෙකු විසින් වඩාත් අවධානය යොමු කළ යුතු මුහුණේ කලාප නම් කරන්න. (ලකුණු 04)

(iii) ඔබ අංගරචනා ශිල්පියෙකු යැයි සිතා නාට්‍යයක අංගරචනය සිදුකරන අවස්ථාවක දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ පැහැදිලි කරන්න. (ලකුණු 06)

04) (i) බන්ධුල ජයවර්ධන විසින් ග්‍රීක නාට්‍යයක් ඇසුරෙන් නිර්මාණය කළ අනුවර්තන නාට්‍යය නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔහුගේ ස්වතන්ත්‍ර නාට්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මෙතුමාගෙන් මෙරට නාට්‍ය කලාවට සිදු වූ සේවාව පැහැදිලි කරන්න. (ලකුණු 06)

05) (i) සමාරෝපය යනු කුමක් දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) සමාරෝපයේ ප්‍රභේද කීයද? ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) රූපණ ශිල්පියෙකු රූපණයේ දී සමාරෝපය භාවිත කරන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06)

06) (i) අධ්‍යක්ෂවරයා යනු කවරෙක් දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) අධ්‍යක්ෂවරයා නළුවරණයේ දී භාවිත කරන ක්‍රම හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) අධ්‍යක්ෂණ ක්‍රියාවලියේ දී ඔහු අනුගමනය කරන ක්‍රියාවලිය පිළිවෙළින් විස්තර කරන්න. (ලකුණු 06)

07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කර ගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකිය.

සුපුරුදු පරිදි නිවස බලා යාමට බස් රථයට ගොඩ වන හිමාලිට දක්නට ලැබෙන්නේ වෙන දා මෙන් තදබදයෙන් පිරුණු බස් රථය නොව, හිස් ආසන පෙළ පමණි ...

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ලකුණු 04)

(iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04)

*****